# සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
# General Information Technology




ඉදිරිපත් කිරීම - W.A.දිලිනි චතුරිකා ජයවර්ධන

ICT විෂය ආචාර්ය

කෑ/මහානාග මහා විද්‍යාලය

කෑගල්ල



සබරගමු දුරස්ථ අධ්‍යාපන මෙහෙවර

THE MISSION OF DISTANCE LEARNING - SABARAGAMUWA

නිපුණතාව 04 - එදිනෙදා ජීවිතයේ කාර්යයන් සඳහා යෙදුම් මෘදුකාංග යොදා ගැනීම.

නිපුණතා මට්ටම 4.3 - ඉදිරිපත් කිරීමක්, වඩාත් ආකර්ෂණීය ලෙස සිදු කිරීම සඳහා, ඉලෙක්ට්‍රොනික සමර්පන මෘදුකාංගයක් භාවිතා කිරීම.

# ඉලෙක්ට්‍රොනික සමර්පණ



# සමර්පණයක් යනු -

කණ්ඩායමක් අරමුණු කොට ගත් , කිසියම් මාතෘකාවක් පැහැදිලි කිරීම, කණ්ඩායමක් ඇමතීම හෝ දේශනයක් පැවැත්වීම වැනි විවිධ අන්දමේ අවස්ථා සඳහා යොදා ගත හැකි ඉදිරිපත් කිරීමකි.








# ඉලෙක්ට්‍රොනික සමර්පණ මෘදුකාංගයක් යනු -

යම්කිසි මාතෘකාවක් හෝ සිද්ධියක් වටා ගොනු කර ගත හැකි කරුණු සමූහයක, වඩාත් ක්‍රමානුකූලව හා කිසියම් පිළිවෙළකට අන් අයට ඉදිරිපත් කිරීමට සහාය වන්නා වූ බහුමාධ්‍ය ලක්ෂණ අන්තර්ගත පරිගණක මෘදුකාංග විශේෂයකි.



# ඵලදායි සමර්පණයක ලක්ෂණ

ඵලදායි සමර්පණයක් අවශ්‍ය වනුයේ එම සමර්පණය නරඹන්නාට ලබාදෙන්නා වූ පණිවිඩය නියමිත ආකාරයෙන් ලබා දීමට අවශ්‍ය ලෙස සකසා ගැනීමටය.

සකසා ගන්නා වූ ඉ - සමර්පණය තුල අන්තර්ගතය පිළිබඳව වඩා වැඩි අවධානයක් යොමු කිරීම තුළින් ගුණාත්මකභාවය වර්ධනය කරගත හැක.



# ඵලදායි සමර්පණයක ලක්ෂණ

- අවශ්‍ය තොරතුරු සන්නිවේදනය කිරීමේ හැකියාවක් තිබිය යුතුය.
- ඒ සඳහා ගැළපෙන රූපසටහන්, ශ්‍රව්‍ය /දෘශ්‍ය අංග, වගු ආදිය යොදාගත යුතුය.
- ප්‍රේක්ෂක අවධානය නොනැසෙනපරිදි සකස් විය යුතුය.
- මාතෘකාව පිළිබඳව ප්‍රේක්ෂකයා තුළ යහපත් ධනාත්මක ආකල්ප ගොඩ නැගීමට සමත් විය යුතුය.

# සමර්පණ මෘදුකාංග සහ ඒවායේ පොදු ලක්ෂණ

- සමර්පණ මෘදුකාංග මඟින් සමර්පණයක් කදා දැක්මක් ආකාරයෙන් සකස් කිරීමට සහ සංස්කරණය කිරීමට හැකියාවක් ලබා දෙයි.
- පාඨ, රූප සටහන් ශ්‍රව්‍ය / දෘශ්‍ය , බහුමාධ්‍ය, ආදී දෑ ඇතුළත් කිරීමට හැකි විය යුතුය.
- සජීවන, සංක්‍රාන්ති ආදිය මගින් සංවිධානය වැඩි දියුණු කළ හැකිය

# සමර්පණ මෘදුකාංග සදහා උදාහරණ

මෙම මෘදුකාංග ප්‍රධාන වශයෙන් වර්ග දෙකකි.

1. නිදහස් සහ විවෘත කේත මෘදුකාංග (Free and Open source Software)
   - උදා- Impress
2. මුදල් ගෙවා ලබා ගත හැකි මෘදුකාංග (Commercial Software)
   - උදා- MS PowerPoint , Apple Keynote

❖ මීට අමතරව ඔබගේ පරිගණකයේ සමර්පණ මෘදුකාංගයක් ස්ථාපිත කර නොමැති නම් අන්තර්ජාලයට පිවිස ක්ලවුඩ් සේවාවන් (Cloud Service)උදව් මත එම කාර්යය ඉටු කර ගැනීමට හැකියාව ඇති අතර අදාළ ගොනු සුරැකීමට ද අවස්ථාව ලබා දී ඇත.

උදා- MS office PowerPoint 365, Prezi, Google presentation

# Microsoft PowerPoint

ඉගෙන ගනිමු.....